සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය ............................ ලංකා ඉතිහාසය I කාලය පැය තුනයි

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 1 සිට 10 තෙක් වූ ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

1 (1) ථූපවංස (2) දීපවංස (3) ධාතුවංස (4) බෝධිවංස (5) හරිවංස (......)

2 (1) දඹදෙණිය (2) යාපහුව (3) කුරුණෑගල (4) නාගදීපය (5) කෝට්ටේ (......)

3 (1) සත්මහල් ප්‍රාසාදය (2) වෛජයන්ත ප්‍රාසාදය (3) ලෝවාමහා ප්‍රාසාදය
(4) නිශ්ශංක ලතා මණ්ඩපය (5) රාජ සභා මණ්ඩපය (......)

4 (1) සීවලී (2) සුනේත්‍රා දේවි (3) අනුලා (4) කල්‍යාණවතී (5) ලීලාවතී (......)

5 (1) සරපෝතිමාලෙ (2) සද්ධර්මරත්නාවලිය (3) පූජාවලිය
(4) කව්සිළුමිණ (5) සමන්තකූට වණ්නනා (......)

6 (1) අදිකාරම් (2) කෝරාළ (3) දිසාවේ (4) ඔවිදෝර් (5) රටේ මහත්තයා (......)

7 (1) පළමුවැනි රාජසිංහ (2) විජය රාජසිංහ (3) කීර්ති රාජසිංහ
(4) රාජාධිරාජසිංහ (5) ශ්‍රී වික්‍රම රාජසිංහ (......)

8 (1) මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ (2) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ
(3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ (4) මෝර්ලි - මින්ටෝ ප්‍රතිසංස්කරණ
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ (......)

9 (1) පෙද්රෝ ලෝපේස් ද සූසා (2) දොන් ජෙරනිමෝ ද අසවේදු
(3) දියෝගෝ ද මේලෝ ද කැස්ත්‍රෝ (4) අන්තෝනියෝ ද සූසා
(5) ගෙරිට් ද හියරෙ (......)

10 (1) ඥනාර්ථ ප්‍රදීපය (2) විජයබා කොල්ලය (3) ලක්මිණි පහන
(4) ලංකාලෝකය (5) ලක්රිවි කිරණ (......)

- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න සඳහා පද යුගළ පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යගළයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගළය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති, තිත් ඉර මත ලියන්න**

11. (1) අනුරාධගම - මල්වතු ඔය
(2) උරුවෙල - කලා ඔය
(3) දීඝවාපි - ගල් ඔය
(4) තම්බපණ්ණි - වන නදී
(5) උපතිස්ස ගාම - ගම්භීර නදී (......)

12. (1) ථූපාරාම දැගැබ - දේවානම්පියතිස්ස
(2) සේරුවිල දාගැබ - කාවන්තිස්ස
(3) අභයගිරි දාගැබ - වළගම්බා
(4) අම්බස්තල චෛතිය - උත්තිය
(5) කිරිවෙහෙර - 1 පරාක්‍රමබාහු (......)

13. (1) වීරසෝලියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි.
(2) පූජාවලිය - දළදා වහනසේට පැවැත්වූ පූජා පිළිබඳ විස්තර ඇතුළත් කෘතියකි
(3) සමන්තපාසාදිකා - විනය පිටකයට අටුවා ග්‍රන්ථයකි.
(4) පැරකුම්බා සිරිත - ප්‍රශස්ති කාව්‍යයකි.
(5) කඳවුරු සිරිත - රජවරුන්ගේ දෛනික ජීවිතය පිළිබඳ විස්තර ඇතුළත් කෘතියකි (......)

14. (1) මේට්ලන්ඩ් - රාජකාරි ක්‍රමය අහෝසි කිරිම
(2) බ්‍රවුන්රිග් - උඩරට රාජ්‍යය බිඳ වැටීම
(3) බාර්න්ස් - කොළඹ- නුවර මාර්ගය ඉදිකිරීම ඇරඹීම
(4) ගොර්ඩන් - කොටහේන කෝලාහලය
(5) හැව්ලොක් - ධාන්‍ය බද්ද අවලංගු කිරීම (......)

15. (1) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ - ගම්සභාව අවලංගු කිරීම
(2) කෲ-මැකලම් ප්‍රතිසංස්කරණ - සීමිත ජන්ද බලය හඳුන්වාදීම
(3) මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ - ප්‍රාදේශීය ජන්ද කොට්ඨාශ ක්‍රමය හඳුන්වාදිම
(4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ - විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදීම
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ - උත්තර මන්ත්‍රී මණ්ඩලය හඳුන්වාදිම (......)

අංක 16 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහY තිරුවල දි ඇත. Y තීරුවේ දක්වා ඇති නාම/ප්‍රකාශන /දින වකවානු X තීරුවේ දි ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉරමත ලියන්න.

16

| X | Y |
|---|---|
| (i) ටැම් ලිපිය | A පනාකඩුව |
| (ii) ගිරිලිපිය | B හෝපිටිගම |
| (iii) පුවරුලිපිය | C දඹදෙණිය |
| (iv) කතිකාවත | D දැදිගම |
| (v) සන්නස | E අම්පිටිය |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

17

| X | Y |
|---|---|
| (i) කුරුන්ද වාපි | A 11 මොග්ගල්ලාන |
| (ii) ගංගාතට වාපි | B 1 අග්ගබෝධි |
| (iii) මණිහීර වාපි | C මහාසේන |
| (iv) බුද්ධගුණ වාපි | D 11 අග්ගබෝධි |
| (v) පත්තපාසාණ වාපි | E 1 විජයබාහු |

(1) BADEC (2) BADEC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

18

| X | Y |
|---|---|
| (i) සුරතිස්ස | A කරිකාළ චෝළ |
| (ii) වංකනාසික තිස්ස | B සේන සහ ගුත්තික |
| (iii) 1 සේන | C 1 රාජ රාජ |
| (iv) iv උදය | D ශ්‍රී මාර ශ්‍රී වල්ලභ |
| (v) v මහින්ද | E 1 පරන්තක |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

19

| X | Y |
|---|---|
| (i) යාපහුව | A විජය කුළන්තෙ චක්‍රවර්ති |
| (ii) යාපනය | B 1භුවනෙකබාහු |
| (iii) දඹදෙණිය | C භුවනෙකබාහු |
| (iv) කුරුණෑගල | D 11 භුවනෙකබාහු |
| (v) ගම්පොල | E 111 විජයබාහු |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

20

| | X | | Y |
|---|---|---|---|
| (i) | සීලවංස ධම්මකිත්ති හිමි | A | සද්ධර්මාලංකාරය |
| (ii) | ජයබාහු ධම්මකිත්ති හිමි | B | පාරමී මහාශතකය |
| (iii) | රාජගුරු ධම්මකිත්ති හිමි | C | සරජෝතිමාලෙ |
| (iv) | ධම්මදින්න විමලකිත්ති හිමි | D | දාඨාවංශය |
| (v) | තේනුවරෙයි පෙරුමාල් | E | සද්ධර්මරත්නාකරය |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

21

| | X | | Y |
|---|---|---|---|
| (i) | ජාකෝම් ගොන්සාල්වේස් පියතුමා | A | සිංහලේ ආණ්ඩුක්‍රමය |
| (ii) | පිලිප්පුස් බැල්දියස් | B | දේවවාද පුරාණය |
| (iii) | ෆර්නාවෝ ද ක්වේරොෂ් | C | ලංකාවේ පනස් වසක් |
| (iv) | තෝමස් ස්කිනර් | D | ලංකා විස්තරය |
| (v) | ජෝන් ඩොයිලි | E | ලංකා අධිපත්‍යය |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

22

| | X | | Y |
|---|---|---|---|
| (i) | 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය | A | සර්වජන ජන්දබලය හඳුන්වාදීම |
| (ii) | 1910 කෲ-මැකලම් ආණ්ඩුක්‍රමය | B | ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම |
| (iii) | 1920 මැනිං ආණ්ඩුක්‍රමය | C | සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වාදීම |
| (iv) | 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය | D | පළාත්බද නියෝජන ක්‍රමය ආරම්භ කිරීම |
| (v) | 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය | E | ජනවාර්ගික නියෝජනය අවලංගු කිරීම |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BCDAE (......)

23

| | X | | Y |
|---|---|---|---|
| (i) | 1797 මුහුදුබඩ කැරැල්ල | A | රොබට් බ්‍රවුන්රිග් |
| (ii) | 1817-1818 නිදහස් අරගලය | B | ද මියුරන් |
| (iii) | 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටන | C | රොබට් චාර්මස් |
| (iv) | 1883 කොටහේන කෝලාහලය | D | ජේම්ස් ලොංඩන් |
| (v) | 1915 කෝලාහල | E | ටොරිංටන් සාමි |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

24

| | X | | Y |
|---|---|---|---|
| (i) | මධ්‍යම පළාත | A | 1848 |
| (ii) | වයඹ පළාත | B | 1833 |
| (iii) | උතුරු මැද පළාත | C | 1889 |
| (iv) | ඌව පළාත | D | 1873 |
| (v) | සබරගමු පළාත | E | 1886 |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDCEA (5) BEDCA (......)

25 X Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රථම සිංහල මන්ත්‍රීවරයා | A | එන්.එම් පෙරේරා |
| (ii) | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රථම උඩරට මන්ත්‍රීවරයා | B | පිලිප්ස් විජේකෝන් පණ්ඩිතරත්න |
| (iii) | ව්‍යවස්ථාදායක මණ්ඩලය තුළ උගත් ලාංකිකයන්ගේ ප්‍රථම නියෝජිතවරයා | C | ඩී.බී ජයතිලක |
| (iv) | රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පළමුවන සභානායක | D | ටී.බී. පානබොක්කේ |
| (v) | පාර්ලිමේන්තුවේ පළමුවන විරුද්ධ පක්ෂ නායකයා | E | පොන්නම්බලම් රාමනාදන් |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

- **අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න**

26. සද්ධාතිස්ස රජුගේ පුතුන් හතරදෙනාගේ නම් දැක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේද?
   (1) ථූලත්ථන, පුලහත්ථ, ලඤ්ජතිස්ස, වට්ටගාමිණී
   (2) ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග, පුලහත්ථ
   (3) ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග, වට්ටගාමණී
   (4) ථූලත්ථන, බල්ලාටනාග, පුලහත්ථ, වට්ටගාමණී
   (5) ලඤ්ජතිස්ස, වට්ටගාමණී, පුලහත්ථ, බල්ලාටනාග (......)

27. ශ්‍රී ලංකාවේ රජකම පිළිබඳ අරගලයක දි එක් පක්ෂයක උදව් පිණිස පිටරට සෙබළුන් ගෙන්වා ගත් පළමු වන සිංහල රජු කවරෙක්ද?
   (1) ඉළනාග (2) සිරිනාග (3) අභයනාග (4) කුඤ්චනාග (5) බුජ්ජනාග (......)

28. පළමුවන පරාක්‍රමබාහු රජු සහ දෙවන ගජබාහු රජු අතර පැවති ආරවුල සමථයකට පත් කිරීම පිළිබඳ ඇති කර ගන්නා ලද ගිවිසුමක වාර්ථාව සඳහන් වන්නේ පහත දැක්වෙන කවර අභිලේඛනයෙහිද?
   (1) දෙවනගල පර්වත ලිපිය (2) ගල්විහාර ලිපිය (3) අඹගමු සෙල්ලිපිය
   (4) සංගමු විහාර සෙල්ලිපිය (5) මිණිපේ සෙල්ලිපිය (......)

29 පෘතුගීසීන්ගේ ආගමික කටයුතු හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදි වේද?
   (1) අන්‍ය ආගම් ඉවසීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
   (2) ආගමික ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම
   (3) රෙපරමාදු ආගම ප්‍රචාරය කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම
   (4) රෝමානු කතෝලික ආගමේ ව්‍යාප්තියට අනුබල දීම
   (5) ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රීලංකාවට පැමිණි ප්‍රථම පූජක තුමා ක්වේරෝස් වීම (......)

30. බ්‍රිතාන්‍ය පාලන යුගයේ දි වාරිමාර්ග සංවර්ධනය සඳහා කටයුතු කළ ආන්ඩුකාරවරුන් හතර දෙනකුගේ නම් පිළිවෙලින් සඳහන් වන්නේ පහත දැක්වෙන කවර ලැයිස්තුවේද?

(1) ෆෙඩ්රික් නෝර්ත්, තෝමස් මෙට්ලන්ඩ්, රොබර්ට් බ්‍රවුන්රිග්, හෙන්රි වෝර්ඩ්

(2) ෆෙඩ්රික් නෝර්ත්, එඩ්වඩ් බාර්න්ස්, හෙන්රි වෝර්ඩ්, ටොරිංටන් සාමි

(3) හෙන්රි වෝර්ඩ්, ටොරිංටන් සාමි, හර්කියුලස් රොබින්සන්, ජේම්ස් ලොංඩන්

(4) හෙන්රි වෝර්ඩ්, විලියම් ග්‍රෙගරි, ආතර් හැව්ලොක්, ආතර් ගෝර්ඩන්

(5) හෙන්රි වෝර්ඩ්, හර්කියුලස් රොබින්සන්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝර්ඩන් (......)

- **අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාල මාතෘකාවට නොගැළපේ එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

31. පැරණි ලක්දිව වාරිමාර්ග පද්ධතිය

(1) කුඩාගම් වැව් කෘෂිකාර්මික සමාජයකට අත්තිවාරම දැමීය.

(2) විශාල වාරිමාර්ග ඉදිරිකිරීමේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රථම පියවර ගත්තේ වසභ රජුය.

(3) මහාසේන රජුගේ පාලන සමයේදි රජයේ මැදිහත් වීමෙන් වාරිමාර්ග ඉදිකිරීමේ වැදගත් පියවරක් ඇතිවිය.

(4) කලාවැවේ සිට අනුරාධපුරයේ තිසාවැවට ජලය සැපයු ජයගඟ කරවන ලද්දේ ධාතුසේන රජු විසිනි.

(5) වාරිමාර්ග පිළිබඳ අයිතිය තිබුණේ රජුට පමණි. (......)

32. දඹදෙණි රාජවංශය

(1) තුන්වන විජයබාහු රජු දඹදෙණි රාජවංශයේ ආරම්භකයා විය.

(2) ඊට පෙර සිටි රජුන් සමග ඔහුට ඥාති සම්බන්ධතා නොතිබිණි.

(3) තුන්වන විජයබාහු රජුට පසුව රාජ්‍යය හිමි වූයේ දෙවන පරාක්‍රමබාහු රජුටය.

(4) චීන සෙන්පති චෙංහෝ විසින් මෙම පෙළපතේ අවසාන රජු චීනයට අල්ලාගෙන යන ලදි.

(5) හතරවන පරාක්‍රමබාහු රජුගේ අභාවයත් සමග ම දඹදෙණි පෙළපත අවසන් විය. (......)

33. විජයබා කොල්ලය

(1) විජයබා කොල්ලය සිදුවූයේ 1521 දීය.

(2) හයවන විජයබාහු රජු ඔහුගේ පුතුන් තිදෙනා විසින් ඝාතනය කරන ලදි.

(3) රජු ඝාතනය කිරීමේ කුමන්ත්‍රණය මෙහෙයවන ලද්දේ අල්බගේරියා විසිනි.

(4) විජයබා කොල්ලයේ දී උඩරට පාලක ජයවීර බණ්ඩාරගේ සහාය වැදගත් විය.

(5) පියා ඝාතනය කිරීමෙන් පසුව කුමාරවරුන් තිදෙනා අතර රාජධානිය බෙදාගන්නා ලදි. (......)

34. ලන්දේසීන් සහ උඩරට රජුන් අතර පැවති සම්බන්ධතා

(1) 1602 දී ලන්දේසින් පළමුවන විමලධර්මසූරිය රජු හමුවීම

(2) ලන්දේසින් උඩරට රාජධානිය ආක්‍රමණය කිරීම සහ 1766 ගිවිසුම

(3) ලන්දේසීන් උඩරට රාජධානිය අල්ලා ගැනිම

(4) 1638 ගිවිසුම

(5) සියමෙන් උපසම්පදාව ගෙන ඒම සඳහා ලන්දේසීන් උඩරට රජතුමාට සහයෝගය දැක්වීම (......)

35. දහනවවන සියවසේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය

(1) බෞද්ධ පරම විඥානාර්ථ සමාගම ආරම්භ කිරීම

(2) උපසම්පදාව යළි පිහිටුවීම

(3) බෞද්ධ අධ්‍යාපනය දියුණු වීම

(4) බෞද්ධ කොඩිය සකස් කිරීම

(5) වෙසක් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් බවට ප්‍රකාශ කිරීම (......)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දි ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගල දැයි තෝරා ඊට අදාල අංකය තිත් ඉරමත ලියන්න**

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය. | නිවැරදිය |
| 2 | නිවැරදිය. | වැරදිය. |
| 3 | වැරදිය. | වැරදිය. |
| 4 | වැරදිය. | නිවැරදිය. |
| 5 | නිවැරදිය. | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි |

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36 | දැදිගම කොට වෙහෙර මහා පරාක්‍රමබාහු රජු විසින් කරවන ලදි. | දෙමළ සිරකරුවන් යොදා පොළොන්නරුවේ දෙමළ මහා සෑය ඉදිකෙරිණි | (............) |
| 37 | පොළොන්නරුවේ සිට මුළු දිවයිනම පාලනය කළ අවසාන පාලකයා වූයේ නිශ්ශංකමල්ල රජුය | නිශ්ශංකමල්ල රජු රාමඤ්ඤ දේශයට හමුදාවක් යැවීය | (............) |
| 38 | උඩරට රාජ්‍යයේ පරිපාලන ඒකක 21 තිබිණි | 1594 දි 1 විමලධර්මසූරිය රජුගෙන් ආරම්භ වූ උඩරට සිංහල රාජවංශය 1815 දි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන් යටතට පත්වීමත් සමගම අවසන් විය. | (............) |
| 39. | ලන්දේසීහු සිය ආගම ප්‍රචාරය කිරීම සඳහා ජෙසුයිට් මිෂනාරිවරුන් යොදා ගත්හ. | ක්වේරෝස් ශ්‍රී ලංකාවේ මිෂනාරි කටයුතුවල යෙදී සිටි කතෝලික පූජකවරයෙකි. | (............) |
| 40. | වැවිලි කර්මාන්තයේ ව්‍යාප්තිය හා ප්‍රවාහන ක්‍රමයේ වර්ධනය අතර අන්‍යොන්‍යය සබඳතාවක් පවතී. | දහනවවන සියවස තුළ වැවිලි කටයුතුවල අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් රජය විසින් මහාමාර්ග හා දුම්රිය මාර්ග ගොඩනංවන ලද අතර එම මාර්ග කෝපි වගාව නව ප්‍රදේශ කරා ව්‍යාප්ත කරවීමට සමත් විය. | (............) |